# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්
# නිමාව කොලොන්නාව

## ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා ලංසු පත්‍රිකාව

## 2025/2026

## KPR/49/2025

කළමණාකාර ප්‍රසම්පාදන,
ප්‍රසම්පාදන කාර්යාලයය,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්
පළමු මහල, නව ගොඩනැගිල්ල,
කොලොන්නාව,
වැල්ලම්පිටිය.

| | | |
|---|---|---|
| දුරකථන අංකය | : | 011 2572155 |
| ෆැක්ස් | : | 011 2572156 |
| ඊ මේල් | : | procure@cpstl.lk |
| දිනය | : | 2025.10.22 |

## ලංසු ආරාධනයයි.

## සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL) 2025/2026 වර්ෂ සඳහා කොලොන්නාව නිමාව ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා ලංසු කැඳවීමයි. (ලංසු අංකය KPR/49/2025)

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ (CPSTL) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC-Minor) සභාපති විසින් 2025/2026 වර්ෂ සඳහා කොලොන්නාව ප්‍රධාන ආපනශාලාව පවත්වා ගෙනයාම සඳහා පිළිගත් ආපනශාලා සේවාවන් සපයන්නන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු මිල ගණන් කැඳවනු ලැබේ.

ලංසුකරණය පිළිබඳ විස්තර තොරතුරු අපගේ (CPSTL) වෙබ් අඩවිය වන www.cpstl.lk වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපි ලේඛණ ආපසු **නොගෙවන** රුපියල් දහසක (1000.00) ගාස්තුවක් **CPSTL** ආයතනයට ගෙවීමෙන් හා කළමණාකරු (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් (ඉල්ලීමක්) ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2025.10.22 වන දින සිට** 2025.11.04 **වන** දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවලදී **09.00** පැයේ සිට **14.00** පැය දක්වා පමණක් ප්‍රසම්පාදන කළමණාකාර ප්‍රසම්පාදන අංශය, පළමු මහල, නව ගොඩනැගිල්ල, කොලොන්නාව වෙතින් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය. තවද ප්‍රසම්පාදන කළමණාකාර කාර්යාලයේදී ගාස්තු ගෙවීමකින් තොරව (නොමිලේ) මෙම ලිපි ලේඛණ පරීක්ෂාකර බැලිම ද කල හැකිය.

සියළුම අයදුම්කරුවන් වෙනුවෙන් ලංසු පිලිබඳ ගැටළු හෝ අපැහැදිලි තැන් සාකච්ඡා කිරීම සඳහා පෙර දැනුවත් කිරීමේ සාකච්ජාවක් **(Pre Bid Meeting) 2025.10.29** දින **පෙ. ව. 10.00** ට **කොලොන්නාව CPSTL ආයතනයේ මානව සම්පත් කළමනාකරණ රැස්වීම් ශාලාවේදී** පැවැත්වීමට කටයුතු කරන බවත්, ඊට සහභාගිවී මෙදිනම ආපනශාලාව පරීක්ෂා කිරීමට හැකි බවත්, දන්වමි.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ආරක්ෂිත බැඳුම්කරයක් (Tender Security) ලෙස **ආපසු ගෙවන** මුදලින් රුපියල් **විසිපන් දහසක් (25,000.00**) මුදලක් CPSTL ආයතනය වෙත ගෙවීමෙන් හෝ එම වටිනාකමෙන් යුත් බැංකු අණකරයක් හෝ අයදුම්පත සමඟ ඇමිණිය යුතුය. අයදුම්පත් සමඟ ඉදිරිපත් කෙරෙන ආරක්ෂිත බැදුම්කරය **2026 පෙබරවාරි 01 දින** දක්වා වලංගු විය යුතුය.

තවද CPSTL ආයතනයේ බැංකු ගිණුමට මෙම මුදල බැරකර අදාල රිසිට්පත සමඟින් ප්‍රසම්පාදන කළමණාකාර වෙත ලිඛිත ඉල්ලීමක් procure@cpstl.lk දරණ ඊමේල් ලිපිනය වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. CPSTL ගිණුමට ආපසු නොගෙවන ගාස්තුව ලැබුණ පසුව ලංසු ලේඛණ කට්ටලය ප්‍රසම්පාදන කාර්යාංශය මඟින් විද්‍යුත් තැපෑලෙන් නිකුත් කරනු ඇත.

නිසි අයුරින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් ලංසු භාරගන්නා අවසාන දිනය වන **2025.11.04** වන දින **14.00** පැයට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගේට්ටුව අභියස ආරක්‍ෂක කාර්යාලයේ තබා ඇති ප්‍රසම්පාදන කාර්යාංශයේ ලංසු පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ tenders@cpstl.lk විද්‍යුත් තැපෑල ලිපිනය වෙත ද ලංසු ඉදිරිපත් කල හැකිය. අදාල දිනයේ නියමිත වේලාවටම එම ලංසු විවෘත කරනු ලබන අතර, ඉහත වේලාව ඉක්මවා ගොස් ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව ද දන්වමි. ලංසු විවෘත කරන අවස්ථාව සඳහා අදාල ලංසුකරුට හෝ ඔහු විසින් ලිඛිතව නම්කරනු ලබන එක් අයකුට පමණක් සහභාගි විය හැකිය. වැඩි දුරටත් අවශ්‍ය විස්තර ලංසු පත්‍රිකාවේ සඳහන්ව ඇත.

සියළුම පැහැදිලි කර ගැනීම් සඳහා දුරකථන **011-2572155** හෝ **011-2572156** මඟින් ප්‍රසම්පාදන කාර්යාලයෙන් විමසිය හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC- Minor),
කළමණාකාර ප්‍රසම්පාදන,
සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
ප්‍රසම්පාදන කාර්යාලය,
පළමු මහල, නව ගොඩනැගිල්ල,
කොලොන්නාව, වැල්ලම්පිටිය.

# සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් (CPSTL)
# ආපනශාලාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඇති කොන්දේසි

## 01 ලංසු අයදුම්කරන කරන ආකාරය

1.1 ආපනශාලා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඉල්ලුම් කිරීමේ දී රුපියල් දහසක (රු. 1,000.00 ) ආපසු නොගෙවන තැන්පතු මුදලක් CPSTL ආයතනය වෙත ගෙවා ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් ලංසු තොරතුරු ලේඛණය ප්‍රසම්පාදන කාර්යාංශයෙන් ලබාගත හැකිය. එම ලේඛණයන් **2025.10.22 වන දින සිට 2024.11.04** දින දක්වා සාමාන්‍ය රාජකාරි දිනවලදි 09.00 පැයේ සිට 14.00 පැය දක්වා නිකුත් කෙරේ.

1.2 ඉදිරිපත් කරන ලංසුවල වලංගු කාලය **2026.01.02** දක්වා විය යුතුය.

1.3 අයදුම්පත් ඉදිරිපත් කිරීමේදි ආරක්ෂිත බැදුම්කරයක් (Tender Security) ලෙස ආපසු ගෙවන මුදලින් රුපියල් **විසිපන් දහසක (25,000.00)** මුදලක් CPSTL ආයතනය වෙත ගෙවීමෙන් හෝ එම වටිනාකමෙන් යුත් මහ බැංකුව අනුමත කරන ලද බැංකුවකින් ලබගත් බැංකු අණකරයක් (**ඇමුණුම් අංක 04**) අයදුම්පත සමඟ ඇමිණිය යුතුය.

1.4 අයදුම්පත් සමඟ ඉදිරිපත් කෙරෙන ආරක්ෂිත බැදුම්කරය (Tender Security) (**ඇමුණුම් අංක 04**) **2026.02.01** දින දක්වා වලංගු විය යුතුය.

1.5 ලංසු ලේඛණ ලබාගත් සියළුම අයදුම්කරුවන් වෙනුවෙන් ලංසු පිලිබඳ ගැටළු හෝ අපැහැදිලි තැන් සාකච්ඡා කිරිම සඳහා පෙර දැනුවත් කිරීමේ සාකච්ඡාවක් **(Pre Bid Meeting) 2025.10.29** දින **පෙ. ව. 10.00ට** **<u>මානව සම්පත් කළමනාකරණ රැස්වීම් ශාලාවේදි</u>** පැවැත්වීමට කටයුතු කරන බවත්, ඊට සහභාගිවී මෙදිනම ආපනශාලාව පරිසෂා කිරීමට හැකි බවත්, දන්වමි.

1.6 කළමණාකාර (මානව සම්පත්) තැනගේ නිර්දේශ මත ලංසු ඉල්ලුම්පත් නිකුත් කරන කාලය තුළ සියළුම ඉල්ලුම්කරුවන් සඳහා ආපනශාලාව පරික්ෂා කිරීමට අවසරය ලබාදෙනු ඇත.

1.7 ආපනශාලාව පවත්වා ගෙන යාම සඳහා තෝරාගනු ලබන ලංසුකරු කොලොන්නාව ආපනශාලාව සඳහා ලබා දි ඇති දේපළ වෙනුවෙන් **කාර්යසාධන බැඳුම්කරයක් (Performance Security)** ලෙස ගිවිසුම් කාලය අවුරුද්දක් දක්වා වලංගු වන පරිදි රුපියල් ලක්‍ෂයක (රු.100,000.00 ක) **ආපසු ගෙවන තැන්පතු මුදලක්** සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය නමින් මුදලින් තැන්පත් කිරීමෙන් හෝ එම වටිනාකමින් යුතු මහ බැංකුව අනුමත කරන ලද වාණිජ බැංකුවකින් ලබගත් බැංකු අණකරයක් **(ඇමුණුම් අංක 05)** ලංසුකරු විසින් ඉදිරිපත් කළ යුතුය. එකි ඇප තැන්පතුව වෙනුවෙන් කිසිඳු පොළියක් CPSTL ආයතනය විසින් ගෙවනු නොලැබේ. CPSTL ආයතනය විසින් සපයනු ලබන උපකරණ **(ඇමුණුම් අංක 02)** සඳහා අලාභහානි සිදුවුව හොත් මෙම ගිවිසුම් කාලසීමාව අවසානයේදි ඒවා තැන්පත් මුදලින් ආවරණය කරගනු ලබන අතර, තැන්පත් මුදලින් ඉතිරි මුදලක් වේ නම් එම මුදල මෙම ගිවිසුම අවසානයේ දි ගොඩනැගිල්ලේ නිරවුල් භුක්තිය හා වට්ටෝරුගත බඩු භාණ්ඩවල නිවරද්‍යතාවය තහවුරු කිරීමෙන් පසු CPSTL ආයතනය විසින් ලංසුකරු වෙත ආපසු ගෙවනු ලැබේ.

1.8 ලංසු බහාලන කවරයේ වම්පස "**කොලොන්නාව ආපනශාලාව සඳහා ලංසු අයදුම්පත 2025/2026-KPR/49/2025**" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් **2025.11.04** වැනි දින **පස්වරු 2.00 ට පෙර** ලැබෙන ලෙස මෙහි සඳහන් ලිපිනයට ලංසු යොමු කළ යුතුය. නැතහොත් CPSTL ආයතනයේ ඇතුල්වීමේ ප්‍රධාන ආරක්‍ෂක දොරටුව අසල තබා ඇති ලංසු පෙට්ටියේ බහාලිය හැක. ලංසුකරුවන්ට ඉහත පරිදි ලංසු ඉදිරිපත් කිරීමට නොහැකි වුව හොත් පමණක් නියමිත පරිදි පුරවන ලද මුල් ලංසු ලිපි ලේඛණවල ස්කෑන් (scan) කරන ලද පිටපත PDF ආකෘතියෙන් (e – bid) tenders@cpstl.lk යන විද්‍යුත් තැපෑල වෙත ද ඉදිරිපත් කල හැකිය. (නමුත් ලංසුකරු විසින් එම තොරතුරුවල මුල්පිටපත් බැදුම්කර ( Tender Security ) ආදිය ප්‍රසම්පාදන කාර්යාංශය වෙත හැකි විගස ලබාදිය යුතුය) අයදුම්පත් භාරගැනිම **2025.11.04 වන දින ප.ව. 02.00** දක්වා වලංගු වන අතර, එම වේලාවේදි ම ලංසුපත් විවෘත කිරීමට කටයුතු කරන අතර, විවෘත කිරීමෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

1.9 ලංසුකරු ආපනශාලාව භාරගත් දින සිට මාස 03 ක අධීක්ෂණ කාලයකට යටත්ව වසරක (01) කාලයක් සඳහා සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ කොළොන්නාව නිමාවේ ආපනශාලා සේවය සැපයීමට බැඳී සිටී. වසරක කාලයකට පසු ආපනශාලා කමිටුවේ නිර්දේශ හා දෙපාර්ශවයේ එකඟතාවය මත CPSTL ආයතනයේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂගේ අනුමැතිය මත තවත් වසරක් සඳහා මිළ ගණන් සංශෝධනයන්ට යටත්ව එම සේවය සැපයීමට කටයුතු කල හැක.

1.10 ලංසුකරු CPSTL ආයතනය සමඟ මාස 13 ක කාලයක ගිවිසුමකට (ඇමුණුම් අංක 06) එළඹිය යුතුය. ගිවිසුම් කාල සීමාව අවසන් වූ දින ලංසුකරු විසින් ගොඩනැගිල්ලේ නිරවුල් භුක්තිය CPSTL ආයතනයට ආපසු භාර දිය යුතුය.

1.11 නියමිත කාලසීමාව අවසන් වීමට පෙර ගිවිසුම අවසන් කිරීමට ලංසුකරු හෝ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය අදහස් කරන්නේ නම් එකී පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත ඒ පිළිබඳව මාසයකට පෙර දැනුම් දිය යුතුය.

1.12 මෙම ගිවිසුම සම්බන්ධයෙන් ඇති වන සියළුම ප්‍රශ්න හා ගැටළු CPSTL ආයතනයේ ආපනශාලා කමිටුව වෙත ඉදිරිපත් කළයුතු අතර, එකී ප්‍රශ්න හෝ ගැටළු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ගනුලබන තීරණය අවසාන තීරණය වේ.

## 02 ඇගයීම් නිර්ණායක

2.1 අයදුම්පත සමඟ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කල යුතුය.

1. මූලික තොරතුරු
   - i. මිළ ගණන් පත්‍රිකාව (ඇමුණුම් අංක 01)
   - ii. දිවුරුම් ප්‍රකාශය (ඇමුණුම් අංක 03)
   - iii. රුපියල් 25,000 ක ආරක්ෂිත බැඳුම්කරයට අදාල රිසිට්පත
   - iv. ලංසුවේ නිශ්චිත වලංගු කාලය තහවුරු කර ඇද්ද යනවග
   - v. පසුගිය වසර තුනක (03) (2023-2025) කලයක් තුළ ලංසුකරු විසින් සපයන ලද සේවාවන් සහ අවම වශයෙන් ආයතන දෙකක් (02) පිළිබඳව අඛණ්ඩව වර්ෂයක කාලයක්වත් පවත්වා ගෙන යන ලද විස්තරයක් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. (සේවක විස්තර, සේවක අර්ථසාධක ගෙවීම් විස්තර, දැනට නිශ්චිතව පවත්වා ගෙන යන ස්ථාන, ආපනශාලා පවත්වා ගෙනයාම සම්බන්ධව අනුමැතිය ලත් සහතික, වෙනත්)
2. වෙනත් තොරතුරු
   - i ආපනශාලා පවත්වා ගෙනයාමට අදාල ව්‍යාපාර ලියාපදිංචි සහතිකය
     ( මෙය 1980 අංක 26 දරණ ආහාර පනතට සහ 2019.06.17 දිනැති අංක 2128/4 දරණ ගැසට් පත්‍රිකාවෙහි සඳහන් වන "ආහාර (පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ) නියේග-2019" රෙගුලාසි වලට අනුව විය යුතුය.)
   - ii ආපනශාලා පවත්වා ගෙනයාම සම්බන්ධව ලැබී ඇති සහතිකපත් කුසලාන ආදිය
   - iii වෙනත් පැසසුම් ලිපි ආදිය
   - iv වීඩියෝ පොටොස් ආදිය
   - v වෙනත් පිළිගත හැකි තොරතුරු

මින් ඉහත අංක 1 මූලික තොරතුරු අතරින් අසම්පූර්ණ **<u>තොරතුරක් හෝ තොරතුරු ඉදිරිපත් කර</u>** තිබීමෙන් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. එහෙත් අයදුම් කරුගේ විස්තර හා හැකියාව පිළිබඳව තාක්ෂණික ඇඟයීම් කමිටුව සෑහීමකට පත් වන්නේ නම් ආරක්ෂිත බැඳුම්කරය හැර සෙසු තොරතුරු අයදුම්කරුවන්ගේ දැනට පවත්වා ගෙන යනු ලබන ආපනශාලාවන්හි සිදුකරනු ලබන ස්ථානීය පරීක්ෂාවන්හිදි සහ අදාල අධ්‍යයන තුලින් විස්තර නැවත ලබා ගැනීමෙන් තහවුරු කරගත හැකිය.

2.2 ප්‍රධාන ආහාර පැකේජය සඳහා උපුටා දක්වන ලද මුළු පිරිවැය අතර සැසඳීම මත ඇගයීම සිදු කරනු ලබන අතර, අවශ්‍ය නම් අනෙකුත් භාණ්ඩ වල මිල සඳහා සැලකිය යුතු ලෙස සාධානුකූලව ප්‍රතිචාර දක්වා ඇති ලංසුකරු හෝ ඔහු සමඟ සාකච්ඡා කර අවශ්‍ය තීන්දු ගත හැකිය.

## 03 ආපනශාලාව පත්වාගෙන යාම සඳහා CPSTL ආයතනයෙන් ලබාදෙන පහසුකම්

3.1 ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ජලය, විදුලිය සහ ගොඩනැගිලි පහසුකම් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය මඟින් ලංසුකරු වෙත නොමිලේ ලබාදෙනු ඇත.

3.2 ආහාර පිසීම සඳහා ආයතනයේ දැනට පවතින භාජන, ගෑස් උඳුන්, බොයිලේරු, පිඟන් භාණ්ඩ ඇතුළු අනෙකුත් උපකරණ **(ඇමුණුම් අංක 02)** CPSTL ආයතනය මඟින් ලබාදෙනු ඇත. අවශ්‍ය අමතර පිඟන් කෝප්ප ඇතුළු අනෙකුත් උපකරණ ලංසුකරු විසින් සපයා ගත යුතුය.

3.3 ආහාර පිසීම සඳහා අවශ්‍ය ගෑස් සහ අනෙකුත් අමුද්‍රව්‍ය සමාගම විසින් ලබා නොදෙන අතර, ආපනශාලා කළමණාකාරිත්වය විසින් අවශ්‍ය දේ සපයා ගත යුතුය.

3.4 ආපනශාලාවේ විදුලි සැපයුම් ජල සැපයුම් ඇතුළු ගොඩනැගිල්ලේ ප්‍රධාන නඩත්තු කටයුතු CPSTL ආයතනය මඟින් කරනු ඇත.

## 04 ආපනශාලාවේ දෛනික කාර්යයන් සහ විවෘතව තබන කාල සීමාවන්

4.1 මෙම ආපනශාලාව ඉරිදා සහ පෝය දිනවල හැර සතියේ සෑම දිනකම පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා විවෘත කර තැබිය යුතුය. එම දිනවලදි පෙ.ව. 6.00 සිට පෙ.ව. 8.00 දක්වා උදෑසන ආහාර ලබාදීමට කටයුතු කල යුතු අතර, දිවා ආහාරය සඳහා පෙ.ව. 11.45 සිට ප.ව. 1.30 දක්වා ආහාර ලබාදීමට කටයුතු කල යුතුය. එමෙන් ම ව්‍යවස්ථාපිත නිවාඩු දිනවලදීත්, විශේෂයෙන් ම අලුත් අවුරුදු නිවාඩු සමයේදීත්, ආපනශාලාව විවෘතව තැබිය යුතුය. තවද ආයතනයේ කළමණාකාරිත්වය විසින් කරන ලද පෙර දැනුම්දීමක දී ආපනශාලාව විවෘතව තැබීමට එකඟ විය යුතුය. ඉහත විවෘත කාල සීමාවන් හැර අනෙක් සෑම විටම ආපනශාලාව වසා තැබිය යුතුය.

4.2 රාත්‍රී කාලයේ අත්‍යවශ්‍ය සේවාවන්හි සේවයේ යෙදෙන සේවක මහත්ම, මහත්මීන් සඳහා රාත්‍රී 11.30 ට කෙටි ආහාර සමඟ තේ සැපයීමද, අළුයම 4.00 ට කිරි තේ සැපයීමට ද, ලංසුකරු අනිවාර්යෙන් ම එකඟ විය යුතුය. ලංසුකරු විසින් ඒ සඳහා අදාළ කාර්යාංශ මගින් තහවුරු කර ලබාගන්නා බිල්පත් මානව සම්පත් කාර්යාංශයට ඉදිරිපත් කිරීමෙන් පසුව ගෙවීම් සඳහා කටයුතු කරනු ලැබේ.

4.3 ලංසුකරු විසින් ම ආපනශාලාව පවත්වාගෙන යා යුතුය. කුමන හේතුවක් මත හෝ ලංසුකරු විසින් ආපනශාලාව හෝ ඉන් කොටසක් පවත්වාගෙන යාමට වෙනත් පුද්ගලයෙකුට **<u>(Sub Contractor)</u>** පැවරීම නොකළ යුතුය. එවැනි පැවරීමක් සනාථ වුවහොත් වහාම කොන්ත්‍රාත්තුව අවසන් කරනු ලබන අතර, ලංසුකරු විසින් තැන්පත් කරනු ලබන මුදල නැවත ගෙවනු නොලැබේ.

4.4 ලංසුකරු විසින් CPSTL ආයතනයේ ලිඛිත අවසරය කලින් ලබා නොගෙන කිසිදු දිනයක ආපනශාලාව වැසීමට කටයුතු නොකළ යුතුය. එසේ තාවකාලිකව හදිසි අවශ්‍යතාවයක් මත වසා තැබීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ලිඛිත අනුමැතිය දින හතකට පෙර ලබා ගත යුතුය.

## 05 ආයතනයේ ආරක්ෂාව සහ පරිහරණය කරන දේපලවල ආරක්ෂාව සුරක්ෂිත කිරීම.

5.1 ආපනශාලාව සඳහා යොදවනු ලබන සේවකයින්ගේ ජාතික හැඳුනුම්පත් හා ඔහු හෝ ඇය පිළිබඳ පොලිස් වාර්තා ලංසුකරු විසින් CPSTL ආයතනයේ ආරක්ෂක අංශය වෙත ලබාදිය යුතුය. එම පොලිස් වාර්තා ලබාදුන් පසුව අදාළ සේවකයින් සඳහා ඇතුළුවීමේ අවසරපත්‍ර CPSTL ආයතනයේ ආරක්ෂක අංශය මඟින් ලබාදෙනු ඇත. සේවයෙන් ඉවත්ව යන සේවකයෙක් වෙතොත් ඔහු/ඇය පිළිබඳව තොරතුරු වහාම CPSTL ආයතනයේ කළමනාකාර ආරක්ෂක වෙත වාර්තා කර එම සේවකයාගේ ඇතුළුවීමේ අවසර පත්‍රය ආරක්ෂක අංශය වෙත වහාම භාරදිය යුතුය.

5.2 CPSTL ආයතනයෙන් ලිඛිත අනුමැතිය ලබා නොගෙන ආපනශාලාව පවත්වා ගෙන යන ගොඩනැගිල්ලට කිසිදු එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ වැඩි දියුණු කිරීමක් ලංසුකරු විසින් නොකළ යුතුය.

5.3 ගොඩනැගිල්ලට හෝ ආයතනය සතු වෙනත් කිසියම් දේපලකට අලාභ හානි සිදු කිරීමක් කළහොත් එකී අලාභය ආයතනයේ ඉංජිනේරු අංශයේ තක්සේරුවට සහ අනුමැතියට යටත්ව ලංසුකරු විසින් CPSTL ආයතනයට ගෙවිය යුතු අතර, එසේ නැතහොත් ලංසුකරු විසින් එකී දේපල තිබූ තත්ත්වයට පත්කිරීම සඳහා දැරිය යුතු සම්පූර්ණ වියදම දරා ඉංජිනේරු අංශය සෑහීමකට පත්විය හැකි පරිදි යථා තත්ත්වයට පත්කළ යුතුය.

5.4 නියමිත දින දී මෙම ගොඩනැගිල්ල නිසි පරිදි ආපසු භාරදීමට ලංසුකරු අපොහොසත් වුවහොත් ගිවිසුම් කාලසීමාව අවසන් වූ දින සිට දිනකට රු. 5000.00 බැගින් කුලියක් CPSTL ආයතනයට ලංසුකරු විසින් ගෙවිය යුතුය.

5.5 ලංසුකරුට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සඳහා CPSTL ආයතන භූමියට ඇතුළු වන පුද්ගලයින්, වාහන සම්බන්ධයෙන් ලංසුකරු වගකිව යුතුය.

5.6 ලංසුකරු විසින් සාමාන්‍ය විදුලි උපකරණ භාවිතා කළයුතු අතර, වැඩි ධාරිතාවයක් ඇති උපකරණ භාවිතා කිරීමට අදහස් කරන්නේ නම් එසේ භාවිතා කිරීමට පෙර CPSTL ආයතනයේ කළමණාකාර (ඉංජිනේරු සේවා) ගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

5.7 ආපනශාලාවට පිටතින් රැගෙන එන අත්‍යවශ්‍ය දේපල හා බඩු භාණ්ඩ සම්බන්ධව ලිඛිත අවසරයක් ලබා ගත යුතුය.

5.8 කිසිදු හේතුවක් මත ආයතනයේ හෝ සේවකයින්ගේ දේපල අවසරයකින් තොරව පිටතට රැගෙනයාම තහනම් වන අතර, එසේ සිදුවුව හොත් එම අදාල සේවකයින් ඉවත් කිරීමට ආයතන බලධාරීන්ට බලය ඇත.

## 06 ආහාර මිල ගණන් නිසි පරිදි පවත්වා ගැනීම

6.1 ඉදිරිපත් කර ඇති මිල ගණන් (**අමුණුම් අංක 01**) CPSTL ආයතනයේ සේවකයින්ට මෙන්ම බාහිර අයට ද බලපැවැත්වේ.

6.2 සෑම ආහාර වර්ගයක ම හා පානීය වර්ගයක ම මිල ගණන් ප්‍රදර්ශනය කළයුතු අතර, පාලන මිලක් නියම කර ඇති එකී වර්ග කිසි විටෙකත් වැඩි මිලකට අලෙවි නොකළ යුතුය.

6.3 ආපනශාලාවේ අලෙවි කරන සෑම ආහාරපාන වර්ගයක්ම නිකුත් කිරීමේදි බිල්පතක් නිකුත් කිරීමට වගබලා ගත යුතුය.

6.4 ලංසුකරු විසින් සඳහන් කරන ලද මිල ගණන් ගිවිසුම් කාලය සඳහා නොවෙනස්ව පැවතිය යුතු අතර, රජය විසින් ප්‍රකාශිත මිල ගණන් හි වෙනස්වීම් මිළ සංශෝධන අත්‍යාවශ්‍ය වෙතොත් ඒ සඳහා පාලන අධිකාරිය වෙත ලිඛිතව ඉල්ලීම් කර අදාල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය.

## 07 ආහාර නිසි ප්‍රමිතියෙන් පිළියෙල කිරීම, ගබඩා කිරීම සහ පිළිගැන්වීම.

7.1 ලංසුකරු විසින් ප්‍රධාන ආහාර සියල්ලක්ම ආපනශාලාව තුලම දිනපතා සකස් කිරීම හෝ
ලංසුකරුගේ නමට ලියාපදිංචි කරන ලද ආහාර සැකසීම සඳහා අනුමත සෞඛ්‍යාරක්ෂිත භාහිර පරිශ්‍රයක ලන්සුකරු විසින් ම, සකස්කර පිසින ලද ආහාර CPSTL ආයතනය වෙත සෞඛ්‍යාරක්ෂිතව රැගෙන ඒම ද සිදුකල හැකිය.

එලෙස පිසින ලද ආහාර පිටතින් රැගෙන එන්නේ නම්,

i) අදාල ආහාර සැකසීමේ පරිශ්‍රය සහ ආපනශාලා පරිශ්‍රය 2012.01.26 දිනැති අංක 1742/26 දරණ ගැසට් පත්‍රිකාවෙහි සඳහන් වන "2011 ආහාර (සනිපාරක්‍ෂක) නියෝග" රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යා යුතුය.

ii) 1980 අංක 26 දරණ ආහාර පනතට සහ 2019.06.17 දිනැති අංක 2128/4 දරණ ගැසට් පත්‍රිකාවෙහි සඳහන් වන "ආහාර (පරිශ්‍ර ලියාපදංචි කිරීමේ) නියෝග - 2019" රෙගුගාසි වලට අනුව ලංසුකරු තම ආයතනය ලියාපදිංචි කර තිබිය යුතුය.

iii) ලංසුකරුගේ ආහාර සැකසීමේ පරිශ්‍රය (අමුද්‍රව්‍ය සහ අමුද්‍රව්‍ය ගබඩා, ආහාර සැකසුම් ස්ථාන ආදිය) පෙර දැනුම්දීමකින් තොරව CPSTL ආයතනය විසින් පෙර නම් කරන ලද නිලධාරීන් හට පරීක්ෂා කිරීමට අවසරදීම සහ ඉහත i සහ ii හි සඳහන් ගැසට් රෙගුලාසි අනුව ඉදිරිපත් කලයුතු ලිපි ලේඛණ ආදිය පරීක්ෂා කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලබාදීම සිදුකල යුතුය.

.

7.2 ආහාර පිසීමේදී සහ පිසින ලද ආහාර ප්‍රවාහනයේදී, ගබඩා කිරීමේදී සහ ආපනශාලාව තුල අතුරා පිළිගැන්වීමේදී, ආහාර ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා අනුමත භාජන සහ උපකරණ (Food Grade) භාවිතා කල යුතුය.

7.3 ආහාර පිළියෙල කිරීමට පෙර ඒවා නිසි පරිදි සෞඛ්‍ය ආරක්ෂිතව පිළියෙල කිරීමටත්, පිසන ලද ආහාර මැස්සන් සහ දූවිල්ලෙන් දූෂණය නොවන පරිදි සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා කළ යුතුය.

7.4 ආහාර ගබඩා කිරීමේදී මස් මාංශ ඇතුළු අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය වෙන වෙනම අධි ශීතකරණ තුළ සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා කළ යුතු අතර, එහි ප්‍රසස්ත උෂ්ණත්වය රැකගැනීමට ශීතකරණය අඛණ්ඩව ක්‍රියාත්මක කලයුතු අතර, ශීතකරණය අක්‍රිය නොකල යුතුය.

7.5 ලංසුකරු විසින් සකස් කරන දිවා ආහාරය සම්බා/රතු කැකුළු බත් පිඟානකට (අඩුම වශයෙන් හාල් කිලෝ එකකින් හයෙන් එකක් (1/6) සමඟ සම්පූර්ණ බිත්තරයක් හෝ හොඳ තත්ත්වයේ මාළු හෝ කුකුළු මස් (ග්‍රෑම් 80 කට නොඅඩු බර සහිතව) ලබාදීමට එකඟ විය යුතුය. තවද දිනපතා ආහාර වේල් සඳහා එකම මාළු වර්ගය ලබා නොදිය යුතු අතර, එය දිනපතා වෙනස් වර්ගයක් විය යුතුය.

7.6 ලංසුකරු විසින් උදේ ආහාර සැපයීමේදී පාන්, බනිස්, සුදු ආප්ප, පිට්ටු, ඉඳිආප්ප, කිරිබත්, කඩල. රතු කැකුළු බත්, මුං ඇට, රොටී, මාළු පාන්, රෝල්ස් ආදී ආහාර වර්ගවලින් මූලික වශයෙන් ආහාර වර්ග අටක්වත් උදේ ආහාරය සඳහා පිළියෙල කළ යුතුය.

7.7 ලංසුකරු විසින් සකස් කරනු ලබන දිවා ආහාරය සඳහා මාළු, මස්, බිත්තර සමඟ බෝංචි, කැරට්, අර්තාපල්, පරිප්පු. පොළොස්. බණ්ඩක්කා, වට්ටක්කා, අළු කෙසෙල්. ගෝවා, බීට්රූට්, මාළුමිරිස්, අල වර්ග, වම්බටු, තක්කාලි වැනි එළවළු වර්ගවල විවිධත්වයක් ඇති කළ යුතුය.

7.8 යෝගට්, අයිස්ක්‍රීම්, හා වෙනත් කිරි නිෂ්පාදනයන් ආදිය පිළිගත් ආයතනවල නිෂ්පාදන පමණක් විකිණිය යුතුය. එම භාණ්ඩවල කල් ඉකුත්වන දිනයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුය.

7.9 ලංසුකරු විසින් ආපනශාලාවේ අලෙවි කරනු ලබන සෑම ආහාර පානයක්ම ගුණාත්මක, රසවත් හා පිරිසිදු තත්ත්වයෙන් පැවතිය යුතුය.

7.10 ආහාර පිසීමේදී සහ පිළිගැන්වීමේ දි ඒ සඳහා නිසි උපකරණ භාවිතා කළ යුතුය.

7.11 ශරීරයට අහිතකර රසකාරක Monosodium Glutamatc (MSG) සහ වෙනත් ද්‍රව්‍ය ආහාර පිසීමේදී භාවිතා නොකල යුතුවේ.

7.12 අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ආයතනයේ වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය නිලධාරී සහ රජයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ගේ පරීක්ෂාවට භාජනය වන අතර ඔවුනගේ මාර්ගෝපදේශයන්ට යටත්ව ආපනශාලාව පවත්වාගෙන යා යුතු වේ.

## 08 කැලිකසල බැහැර කිරීම හා නිසි ලෙස පරිසිදුව පවත්වා ගැනීම

8.1 එක් දිනක් තුළ ඉතිරි වන ආහාර එදිනම විනාශ කළයුතු අතර, ඒවා පසු දින ප්‍රයෝජනය සඳහා කිසිසේත් ම යොදා නොගත යුතුය. සෑම දිනකම එකතු වන අපවිත්‍ර දෑ වර්ගීකරණය කර (ඉදුල්, ප්ලාස්ටික්, කඩදාසි) ආයතනයෙන් යොදවා ඇති කුණු කසල ඉවත් කරන ජංගම රථයට භාරදිය යුතුය.

8.2 පළුදු වලින් තොර විදුරු පිඟන් භාණ්ඩ භාවිතා කළයුතු අතර, දිනපතා ම පිරිසිදු කාරක ද්‍රව්‍යයක් යොදා ඒවා සෝදා පිරිසිදු කළ යුතුය.

8.3 සෑම විටම ගොඩනැගිල්ලේ ගෙබිම බිත්ති, ගෘහ උපකරණ සහ ආහාර ගබඩා කරන රාක්ක ආදිය දිනපතා පිරිසිදු කර පවිත්‍රව තබාගත යුතුය. විශේෂයෙන් කෑම මේස ආදිය වරින් වර පිරිසිඳු කලයුතු අතර, ඉඳුල් ආහාර පිඟන් හා අපද්‍රව්‍ය මේසවල ඇත්නම් පිරිසිඳු කල යුතුය.

8.4 කසල කළමනාකරණය සඳහා නිසි කසල බඳුන් මුළුතැන් ගෙය පරිශ්‍රයේත්, ආපනශාලා පරිශ්‍රයෙත් තැබීමටත්, ඒවා එදිනෙදා පිරිසිදු කිරීමටත්, වගබලා ගත යුතුය.

8.5 පිසින ලද ආහාර හා අනෙකුත් අමුද්‍රව්‍ය මීයන්, කැරපොත්තන්, හූනන්,කෘමිසතුන් හා කපුටන් වැනි සතුන්ගෙන් ආරක්‍ෂාකර ගැනීමට පුමුඛත්වය දිය යුතුය. (ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසීම අනිවාර්ය වේ)

## 09 ආහාර අලෙවිය

9.1 CPSTL ආයතනය විසින් සපයා ඇති පහසුකම් උපයෝගි කරගෙන ලංසුකරු විසින් සකස් කරනු ලබන ආහාරපාන ආපනශාලාවේ අලෙවි කිරීමට පමණක් සීමා විය යුතුය. වෙනත් කිසිම හේතුවක් මත පිටස්තර ආයතන, පුද්ගලයින් වෙනුවෙන් ආහාරපාන මෙම ආපනශාලාවේ සකස් කිරීම සපුරා තහනම් වේ. (ටැංකිරථ රියදුරර/ රිය සහායක, කොන්ත්‍රාත් කරුවන් සහ වෙනත්)

9.2 ලංසුකරු විසින් අලෙවි කරන ආහාර හා බීම වර්ග අත්පිට මුදලට පමණක් අලෙවි කළ යුතුය. පෞද්ගලිකව ණය පහසුකම් මත කිසිඳු පුද්ගලයෙකුට ආහාර අලෙවි නොකල යුතු අතර ඒ සඳහා CPSTL ආයතනය වගකියනු නොලැබේ.

9.3 කිසිවිටෙකත් කල් ඉකුත් වූ හා භාවිතයට නුසුදුසු ආහාර හෝ බීම වර්ග අලෙවි නොකල යුතුය.

## 10 ආපනශාලා සේවකයින්ගේ ස්වස්ථතාවය

10.1 **ආපනශාලාවේ සියළුම සේවකයින් පිරිසිඳු ඇඳුමකින් හෝ නිළ ඇඳුමකින් සැරසී සිටීමටත්, නිය, රැවුල, කොණ්ඩය කොටට කපා හිස් වැසුම් පැළඳ සේවයේ යෙදවීමටත්, ලංසුකරු වගබලා ගත යුතුය.**

10.2 යම් සේවකයෙක් කිසියම් චර්ම රෝගයකින් හෝ වෙනත් කිසියම් බෝවන රෝගයකින් පෙළේ නම් ඔහු/ ඇය සේවයේ නොයෙද විමටද, සීරීම්, කැපීම් වැනි සුළු තුවාල සහිත සේවකයින් සිටී නම් ඔවුන් ඒවා හොඳින් ආවරණය කර සේවයේ යෙදවීමට ලංසුකරු වගබලා ගත යුතුය.

10.3 සියළුම සේවකයින් නියම කරන විටකදි වෛද්‍ය පරීක්‍ෂාවකට භාජනය විය යුතුය.

## 11 ආපනශාලා සේවකයින්ගේ සුහසාධනය සහ විනය.

11.1 ආපනශාලාවට පැමිණෙන CPSTL කාර්යමණ්ඩලය හෝ වෙනත් බාහිර පුද්ගලයින් සමඟ ආරවුල් ඇති නොකර ගතයුතු **බවට අවධාරණය කරන** අතර, කිසියම් පැමිනිල්ලක් වේ නම් ආරක්ෂක කළමණාකාරට **මානව සම්පත් කළමනාකාරට** සහ ආපනශාලා අධික්‍ෂණ කමිටුව වෙත **ලිඛිතව** පැමිනිලි කළ යුතුය.

11.2 ආපනශාලාවේ සේවා නියුක්ත කරන ලද යම් පුද්ගලයෙකු **නීති විරෝධි / විනය විරෝධි** ලෙස හැසිරෙන්නේ නම් CPSTL ආයතනයෙන් කරන ලද දැනුම්දීමක දි එම පුද්ගලයා සේවයෙන් ඉවත් කළයුතු අතර, CPSTL

ආයතනයේ පූර්ව ලිඛිත අවසරයෙන් තොරව එම පුද්ගලයා නැවත ආපනශාලාවේ සේවා නියුක්ත නොකළ යුතුය.

11.3 මෙම ආපනශාලාව සඳහා සේවකයින් බඳවා ගැනීම, ඔවුන්ට වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම, කම්කරු නීති අනුව සේවයේ යෙදවීම, ඔවුන්ගේ සේ.අ.අ. **<u>සේවක භාරකාර අරමුදල ගෙවීම</u>** හා සේවය නිසා ඇති විය හැකි ගැටළු පිළිබඳ සම්පූර්ණ වගකීම ලංසුකරු සතු වගකීම වේ.

11.4 ලංසුකරු ආපනශාලාවේ සේවය **<u>බාධාවකින් තොරව</u>** කිරීමට ප්‍රමාණවත් සේවකයන් සංඛ්‍යාවක් සේවයෙහි යෙදවීමට වගබලා ගත යුතුය. එමෙන්ම**,** ප්‍රමාදයකින් තොරව හා ක්‍රමවත්ව **<u>නියමිත වේලාවන් තුළ</u>** ආහාරපාන පිළිගැන්වීම සිදුකළ යුතුය.

11.5 CPSTL ආයතනයේ හෝ ආයතනයට සම්බන්ධ කිසිම සේවක මහත්මයෙක් හෝ මහත්මියක් ආපනශාලාවේ කටයුතු වලට සම්බන්ධකර ගැනීම සපුරා තහනම් වේ.

11.6 ආපනශාලා සේවකයින් ආයතනයේ පවත්නා ප්‍රවේසම් නීතිරීති වලට සහ ආරක්ෂක නීතිරීති වලට අනුගත වියයුතු අතර, ආපනශාලාව තුල මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්වැටි පානය කිරීම සපුරා තහනම් වනු ඇත. එවැනි සේවකයින් ආපනශාලාවෙන් ඉවත් කිරීමට ආරක්ෂක කළමණාකරුට බලය පැවරී ඇත. එබැවින් කිසිදු මත්ද්‍රව්‍යයකට හෝ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයින් ආපනශාලා සේවකයින් ලෙෂ යොදා නොගත යුතුය.

## 12 ආපනශාලාවේ කටයුතු අධීක්ෂණය.

12.1 ලංසුකරු විසින් ආපනශාලාවේ උපකරණ හා ආපනශාලාව අවට ප්‍රදේශය පිරිසිදු තත්ත්වයෙන් පවත්වා ගෙන යායුතු අතර, පාලනාධිකාරිය විසින් බලය පවරනු ලබන නිලධාරින්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ආපනශාලාව පරීක්ෂාකර බැලීමට ඉඩ දීමට එකඟ විය යුතුය. (වෙනත් අනවසර සේවකයින් ආපනශාලාව තුලට කිසිසේත් ඇතුල් කිරීම නොකල යුතුය.

12.2 ආපනශාලා අධීක්ෂක කමිටුව දෛනිකව ආපනශාලාව පරීක්ෂා කරනු ලබන අතර, ඔවුන්ගේ මාර්ගයෙන් ලංසුකරු විසින් අදාළ පැමිණිලි හෝ යෝජනා පාලනාධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

12.3 ආයතනයේ නිලධාරීන් ආපනශාලා සේවකයින්ට කරදර නොවන සේ කටයුතු කලයුතු අතර සෑම අයකුම එම ස්ථානයේ පවත්නා නීතිරීති වලට එකඟව කටයුතු කල යුතුය,

12.4 ලංසු පෝරමයේ සඳහන්ව ඇති කොන්දේසි කඩවීමක් සම්බන්ධව පාලනාධිකාරිය වෙත පැමිණිල්ලක් ලැබුනහොත් ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඒ බව ඔප්පු වුවහොත් ඕනෑම වේලාවක ඔබගේ ලංසුව අවලංගු කිරීමට ද CPSTL ආයතනයට හැකියාව ඇත.

ඇමුණුම 01

**සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ කොලොන්නාව ආපනශාලාව**

**ප්‍රධාන ආහාර පැකේජය ( දිනක )**

| | වර්ගය | ඒකක ප්‍රමාණය | ඒකකයක මිල (රු) | එකතුව (රු) |
|---|---|---|---|---|
| 1 | **එළවළු කෑම - බත් භාගයක්** (සම්බා, රතු කැකුළු) එලවළු 03 ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම් ) | 50 | | |
| 2 | **එළවළු කෑම - බත් පිඟානක්** – **Full** (සම්බා, රතු කැකුළු) එලවළු 03 ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පඩම් ) | 60 | | |
| 3 | **මාළු, කෑම - බත් භාගයක්** (සම්බා, රතු කැකුළු) මාළු, එලවළු 03 ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම් ) | 50 | | |
| 4 | **මාළු, කෑම -බත් පිඟානක් - Full** (සම්බා, රතු කැකළු) මාළු, එලවළු 03 ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම් ) | 40 | | |
| 5 | **බිත්තර කෑම - බත් භාගයක්** (සම්බ, රතු කැකුළු) බිත්තර ,එලවළු 03 ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම් ) | 45 | | |
| 6 | **බිත්තර කෑම - බත් පිඟානක් - Full** (සම්බා, රතු කැකුළු) බිත්තර,එලවළු 03 ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම් ) | 40 | | |
| 7 | **කුකුල් මස් කෑම - බත් භාගයක්** - (සම්බා, රතු කැකුළු) කුකුල් මස්, එලවළු 03 ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම් ) | 65 | | |
| 8 | **කුකුල් මස් කෑම - බත් පිඟානක් - Full** (සම්බා, රතු කැකුළු) කුකුල් මස්, එලවළු 03 ක් හා මැල්ලුමක් හෝ බැදුමක් සමඟ පපඩම් ) | 65 | | |
| 9 | **උදෑසන රතු කැකුළු බත්** (බැදුමක් හොදි සම්බෝල සමඟ) | 70 | | |
| 10 | **නූඩ්ල්ස් පිරිසියක්** (බිත්තර සමඟ කිරි හොද්දක්) | 35 | | |
| 11 | **ඉඳි ආප්ප** (හාල් පිටි) 15 සමඟ සම්බෝල සහ හොදි | 100 | | |
| 12 | **තෝසේ එකක් සමඟ** (හොදි සම්බෝල සමඟ) | 30 | | |
| 13 | **විශේෂ කෑම පාර්සලයක්** (කුකුල් මස් සහිත) - (Fried Rice ) | 35 | | |
| | **මුළු ආහාර පැකේජයෙහි දවසක එකතුව** | | | |

ඒකක ප්‍රමාණය දළ වශයෙන් සඳහන් කර ඇත

**ඇමුනුම් අංක 01 ට අදාල මෙම මිල ගණන් ........................ දින දක්වා වලංගු වේ.**

**වෙනත් උදෑසන ආහාර සහ අනෙකුත් අමතර ආහාර /බීම වර්ග**

| | **වර්ගය** | **රු ශත** |
|---|---|---|
| 14 | අමතර බත් පිරිසියක් (එලවළු සහිත) | |
| 15 | අතිරේක එලවළු පිරිසියක් | |
| 16 | කුකුල් මස් පිරිසියක් | |
| 17 | මාළු පිරිසියක් | |
| 18 | අර්තාපල් පිරිසියක් | |
| 19 | පරිප්පු පිරිසියක් | |
| 20 | ඔම්ලට් එකක්(සම්පූර්ණ බිත්තරය සමඟ) | |
| 21 | බුල්සායි එකක් (සම්පූර්ණ බිත්තරය සමඟ) | |
| 22 | බැදපු මාළු කුරියෙක් | |
| 23 | සීනි සම්බෝල පිරිසියක් | |
| 24 | කට්ට සම්බෝල පිරිසියක් | |
| 25 | සාමාන්‍ය පරිමාණයේ හාල් පිටි පිට්ටු කැබැල්ලක් | |
| 26 | සාමාන්‍ය පරිමාණයේ තිරිඟු පිටි පිට්ටු කැබැල්ලක් | |
| 27 | කිරිබත් කැබැල්ලක් සාමාන්‍ය පරිමාණයේ (කට්ට සම්බොලයක් / සීනි සම්බල් සමඟ) | |
| 28 | තම්බාපු මඤ්ඤොක්කා පිරිසියක් (කට්ට සම්බෝල පොල් සමඟ) | |
| 29 | කඩල පිරිසියක් **(කට්ට සම්බෝල පොල් සමඟ)** | |
| 30 | කවුපි පිරිසියක් **(කට්ට සම්බෝල පොල් සමඟ)** | |
| 31 | වඩේ එකක් (පරිප්පු) | |
| 32 | ගෝදම්බ රොටි **(හොදි සමඟ)** | |
| 33 | පොල් රොටි **(කට්ට සම්බෝල)** | |
| 34 | බිත්තර රොටි (හොදි සමඟ) | |
| 35 | බතල පිරිසියක් **(කට්ට සම්බෝල පොල් සමඟ)** | |
| 36 | මාළු පාන් එකක් | |
| 37 | බිත්තර පාන් එකක් (බිත්තර 1/2 ක් සමඟ) | |

| | | |
|---|---|---|
| 38 | රෝස් පාන් එකක් | |
| 39 | ටී බනිස් එකක් | |
| 40 | බටර් බනිස් එකක් | |
| 41 | එලවළු රොටී එකක් | |
| 42 | මාළු රෝල් (චයිනිස් රෝල්) | |
| 43 | බිත්තර රෝල් | |
| 44 | පැටිස් | |
| 45 | කට්ලට් | |
| 46 | බටර් කේක් | |
| 47 | ෆෑටි කේක් | |
| 48 | ඥාණකතා | |
| 49 | ස්පංචි එකක් | |
| 50 | සාමාන්‍ය ප්‍රමාණයේ ඇඹුල් කෙසෙල් ගෙඩියක් | |
| 51 | සාමාන්‍ය ප්‍රමාණයේ ආනමාළු කෙසෙල් ගෙඩියක් | |
| 52 | සාමාන්‍ය ප්‍රමාණයේ කෝලිකුට්ටු කෙසෙල් ගෙඩියක් | |
| 53 | කහට කෝප්පයක් හකුරු සමඟ | |
| 54 | තේ කෝප්ප එකක් | |
| 55 | කිරි කහට කෝප්පයක් | |
| 56 | කිරි තේ කෝප්පයක් | |
| 57 | කෝපි එකක් | |
| 58 | කිරි කෝපි එකක් | |
| 59 | බිත්තර කෝපි එකක් | |
| 60 | සැලඩ් එකක් (ශීතකල) | |
| 61 | කිරි පැණි එකක් | |

**ඇමුණුම – "3"**

**<u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>**

**........................................................................................................ හි පදිංචි ........................................................ වන මම මෙහි සඳහන් මූලික කොන්දේසි වලට යටත්ව කොලොන්නාව නිමාවේ පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි ආපනශාලාව පවත්වා ගෙන යාමට එකඟ වන බවත්, මා විසින් සපයනු ලබන ආහාර පාන වර්ග සඳහා මීට යාකර ඇති ලැයිස්තුවේ (ඇමුණුම් අංක 01) දැක්වෙන මිල ගණන් වලට නොවැඩි අය කිරීමට එකඟ වන බවත්, විශේෂයෙන් ම මෙම ස්ථානයේ යම් කිසි කාර්යයක යෙදීමට හෝ ඉදිරිපත් කර ඇති මිල ගණන් වැඩි කිරීමට අවශ්‍ය වුවහොත් එසේ කිරීමට ප්‍රථමයෙන්** CPSTL **සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්‍ෂකගේ කැමැත්ත ලිඛිතව ලබා ගැනීමට එකඟ වන බවත්, මීට යාකර ඇති ලැයිස්තුවේ සඳහන් නොවන දෙයක් භෝජනාගාරයේ අලෙවි කිරීමට පෙර ඒ සඳහා අය කරන ගාස්තු ප්‍රමාණය සභාපති/කළමණාකාර අධ්‍යක්‍ෂකගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුගෙන් හෝ අනුමැතිය ලබා ගන්නා බවත්, මා විසින් භාර ගන්නා අවස්ථාවේදී භාරගත් බඩු බාහිරාදිය නොඅඩුව ආපසු ලබා දෙන බවටත්, ඉහත මෙම වගකීම් සඳහා අවශ්‍ය වන පරිදි රුපියල් ලක්‍ෂයක (100,000.00) මුදලක්** CPSTL **ආයතනය නමින් මුදලින් හෝ බැංකු අණකරයක්** (Performance Bond) **වශයෙන් තැන්පත් කරන බවත්, (ඇමුණුම් අංක 05) එමෙන්ම මාස 3 ක අධීක්‍ෂණ කාලයකට යටත්ව ගිවිසුමකට අත්සන් කිරීමට එකඟ වන බවත්, සමාගමේ ආරක්‍ෂාවට හා ගෞරවයට පටහැනි වන කිසිම ක්‍රියාවක් නොකිරීමට හෝ සිදුවන්නට ඉඩ නොතැබීමට වගබලා ගන්නා බවත්, මා විසින් සමාගමට ගෙවිය යුතු වන සියළුම කුලී හා බදු මුදල් ආදිය සෑම මසකම 10 වැනි දිනට ප්‍රථම ගෙවා අවසන් කිරීමට එකඟ වන බවත්, ඉහත කරුණු එකක් හෝ කීපයක් මා වෙතින් කඩවුව හොත් මා විසින් කර ඇති තැන්පතුවෙන් දඩ මුදල් ලෙස සමාගමට අයකර ගතහැකි බව මා දන්නා බවත්, ඉහත ප්‍රකාශය කියවා බලා හොඳින් තේරුම් ගෙන අත්සන් තැබූ බවත්, මෙයින් සහතික කරමි.**

.....................................

**ලංසුකරුගේ අත්සන**

**දිනය** ..................................

**දුරකථන අංකය** : ..........................................................................

**ඊ මේල්** : ..........................................................................

**දිනය** : ..........................................................................

**ජාතික හැඳුනුම්පත් අංකය** : ..........................................................................

(ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඇමිනිය යුතුය.)

**FORM OF TENDER SECURITY**

**BOND NUMBER :……………………………… DATE :…………………….**

**SUM GUARANTEED :…………………………………**

To :

Chairman
Ceylon Petroleum Storage Terminals Limited
C/o Procurement Manager
1st Floor, New Building
Kolonnawa Installation
Kolonnawa
Sri Lanka

Dear Sir,

By this Bond we……………………………………………………………............................ (hereinafter called "the Tenderer") and we ……………………………………………………………………(name of Bank or insurance company) whose registered office is at …………………………………………………………………………………….(hereinafter called "the Surety") are held and firmly bound into …………………………………………………………(hereinafter called "the Authority") in the sum of ………………………………………..for the payment of which sum the Bidder and the Surety bind themselves their successors and assigns jointly and severally by these present.

Whereas the Authority has invited the Tenderer and other persons to complete tenders in similar terms for the supply of …………………………………………………………………………and works associated (hereinafter called "the Tender") in accordance with such invitation, the Bond shall provide security to the Authority that the Tenderer will honour certain obligations to be undertaken by him in the Tender in accordance with the following conditions.

Now the Conditions of this Bond are :

(a) that it shall remain in full force and effect until the earliest of

(i) **(Date), being Ninety (90)** days from (submission date), the date stipulated by the Authority for the submission of tender, or any prolongation of such date above notified to the Authority by the Tenderer and the Surety in writing:

(ii) In the event of the Tender by the Authority, the date upon which the Tender provides a performance security to the Authority in accordance with the terms of the contract thereby made between them, or

(iii) In the event of acceptance of the Authority of a tender for the work from a third party the date upon which such third party provides the relevant performance security.

(b) Subject to this Bond being in full force and effect, the Surety shall pay the full amount specified in this Bond upon receipt of first written demand from the Authority stating that

(i) The Tenderer has withdrawn his Tender during the Tender period, or

(ii) The Tenderer has failed to provide a performance security to the Authority in accordance with the terms of the contract between them upon acceptance of the Tender.

No alteration in the terms of the Tenderer, nor any forbearance or forgiveness in or in respect of any matter or thing concerning the Tender on the part of the Authority, nor any objection from the tenderer shall in any way release the Surety from any liability under this Bond.

The benefit of this Bond shall not be assignable by the Authority and upon its ceasing to be in full force and effect the Authority shall return the same to the Tenderer.

This Bond shall be governed by the laws of Sri Lanka.

I executed as a Date this (     ) day of (   ) 2026 (    )

For and on behalf of the Tenderer………………for and on behalf of the Surety…………

……………………………………………………………………………………………........

Signed by…………………………………… Signed by…………………………………….

In the capacity of ………………………… In the capacity of ……………………………

And by……………………………………….And by………………………………………..

In the capacity of…………………………….In the capacity of …………………………….

Seal (where applicable) Seal (where applicable)

**FORM OF PERFORMANCE SECURITY**

**BOND NUMBER :……………………………… DATE :…………………….**

**SUM GUARANTEED :…………………………………**

To :

Chairman
Ceylon Petroleum Storage Terminals Limited
C/o Procurement Manager
1st Floor, New Building
Kolonnawa Installation
Kolonnawa
Sri Lanka

Dear Sir,

Whereas………………………………………………………………………………………… ………. (name and address of contractor) Thereinafter called "the contractor" has undertaken, in pursuance of contract no………………………………………………………...dated…………… to executes……………………………………………………………......(name of contract) thereinafter called "the contract"

And whereas it has been stipulated by you in the said Contract that the Contractor shall furnish you with a Bank Guarantee by a recognized Bank for the sum specified therein as security for compliance with his obligations in accordance with the Contract.

And whereas we have agreed to give Contractor such a Bank Guarantee.

Now therefore we hereby affirm that we are the Guarantor and responsible to you, on behalf of the Contractor, up to a total of …………………………………………………………(amount of Guarantee)…………………………………………………………(amount in words), such sum being payable in the type and proportions of currencies in which the Contract price is payable, and we undertake to pay you, upon your first written demand and without cavil or argument, any sum or sums within the limits of ……………………………………………………………..(Amount of Guarantee) as aforesaid without your needing to prove or to show ground or reasons for your demand for the sum specified therein.

We hereby waive the necessity of your demanding the said debt from the contractor before presenting uswith the demand.

**Contd……**

We further agree that no change or addition to or other medication of terms of the contract or of the works to be performed there under or of any of the contract document which may be made between you and the Contractor shall in any way release us from any liability under this Guarantee, and we hereby waive notice or any such change, addition or modification.

This Guarantee shall be valid until 365 days from the date of confirmation of the tender to run the Canteen at Kolonnawa Installation **- KPR/49/2025**

Signature and Seal of the Guarantor……………………………………………………….

Name of the Bank :……………………………………………………….

Address of the Bank :……………………………………………………….

:……………………………………………………….

Date :………………………….

Witness :………………………….

## <u>සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් හි කොලොන්නාව තෙල් ගබඩා පර්යන්තයෙහි ආපනශාලාව පවත්වාගෙනයාම සඳහා වූ ගිවිසුම</u>

මෙහි පහත **දිමණාකාර සමාගම** යනුවෙන් හඳුන්වනු ලබන වැල්ලම්පිටිය, කොළොන්නාව ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යනු ලබන 1982 අංක 17 දරණ සහ 2007 අංක 07 දරණ සමාගම පනත් යටතේ සහ 1987 අංක 23 දරණ සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්ථනය කිරීමේ පනතේ ප්‍රතිපාදන යටතේ සමාගමක් වශයෙන් සංස්ථාපනය කරන ලද සහ අංක 310/8 සහ 2003.10.13 දින දරණ ගැසට් නිවේදනය මඟින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතුව තිබූ ඉන්ධන රැස්කිරීමේ හා බෙදාහැරීමේ කාර්යයන් පවරා ගනුලැබූ **සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් පළමු පක්ෂය** ලෙසද,

සහ

මෙහි පහත **ගැණුම්කරු** යැයි හඳුන්වනු ලබන, ............................................................................... **පදිංචි,** ............................................................................... යන අය **දෙවන පක්ෂය ලෙසද**, බැඳි එකී දිමණාකාර සමාගමට අයත් කොලොන්නාව පර්යන්තයෙහි පිහිටි ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් පිළිගැනීම් හා කොන්දේසි වලට එකඟ වෙමින් ඇතිකර ගනු ලබන ගිවිසුමයි.

එකී ගිවිසුමේ කොන්දේසි හා පිළිගැනීම් කවරේද යත්,

1. මෙම ගිවිසුමේ දිමණාකාර සමාගමට අයත් කොලොන්නාව පර්යන්තයෙහි පිහිටි ආපනශාලාව ................................ **දින සිට** ................................ දින දක්වා මාස ................( ...... ) කාලයකට පවත්වාගෙන යාමට දෙවන පක්ෂයට අවසර දෙනු ලැබේ.

2. ගැණුම්කාර දෙවන පක්ෂය විසින් සපයනු ලබන ආහාරපාන වර්ග මෙම ගිවිසුමේ පළමු වන උපලේඛණයේ ලැයිස්තුවේ දැක්වෙන මිළ ගණන් වලට නොවැඩි විය යුතුය.

3. මෙම ගිවිසුමේ පළමුවන උපලේඛනයේ ලැයිස්තුවේ සඳහන් නොවන යම් දෙයක් භෝජනාගාරයේ අලෙවි කිරිමට පෙර එකී ආහාර ද්‍රව්‍ය හා එය විකිණීමට තබන මිල පිළිබඳව දිමණාකාර සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂකගේ හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිළධාරියෙකුගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

4. මෙම ගිවිසුමේ පළමුවන උපලේඛනයේ ලැයිස්තුවේ නියමකර ඇති ආහාරපාන එහි නියමකර ඇති මිළට වඩා වැඩි මිලකට විකිණීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා දිමණාකාර සමාගමේ සභාපති/ කළමණාකාර අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිළධාරියෙකුගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

5. මෙම ආපනශාලාව දෙවන පක්ෂය විසින් බාරගනු ලබන අවස්ථාවේදී එකී පක්ෂය විසින් බාර ගන්නා බඩු බාහිරාදිය නොඅඩුව ආපසු බාරදිය යුතුය.

6. ආපනශාලාව පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ජලය, විදුලිය සහ ගොඩනැගිලි පහසුකම් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් කොලොන්නාව පර්යන්තය මඟින් දෙවන පක්ෂය වෙත නොමිලේ ලබාදෙනු ඇත.

7. දෙවන පක්ෂයට ආහාර පිසීම සඳහා ආයතනයේ දැනට පවතින භාජන, ගෑස් උඳුන්, බොයිලේරු, පිඟන් භාණ්ඩ ඇතුළු අනෙකුත් උපකරණ පළමු පක්ෂය සතු කොලොන්නාව පර්යන්තය මගින් ලබා දෙනු ඇත. එකී උපකරණ අදාල ලංසු පත්‍රිකාවේ දෙවන ඇමුණුමේ සඳහන් වේ. අවශ්‍ය අමතර පිඟන් කෝප්ප ඇතුළු අනෙකුත් උපකරණ ගැණුම්කරු විසින් සපයා ගත යුතුය.

8. ආහාර පිසීම සඳහා අවශ්‍ය ගෑස් සහ අනෙකුත් අමුද්‍රව්‍ය පළමු පක්ෂය විසින් ලබා නොදෙන අතර, ගැණුම්කරු විසින් අවශ්‍ය දේ සපයා ගත යුතුය.

9. ආපන ශාලාවේ විදුලි සැපයුම් ජල සැපයුම් ඇතුළු ගොඩනැගිල්ලේ ප්‍රධාන නඩත්තු කටයුතු පළමු පක්ෂය සතු කොලොන්නාව තෙල් පර්යන්තය මඟින් කරනු ඇත.

10. ගිවිසුම්ගත ආපනශාලාව ඉරිදා සහ පෝය දිනවල හැර සතියේ සෑම දිනකම පෙ.ව 6.00 සිට පෙ.ව 7.30 දක්වාත්, පෙ.ව 11.45 සිට ප.ව 13.00 දක්වාත් අනිවාර්යයෙන් ම විවෘත කර තැබිය යුතුය. එමෙන් ම ආයතනයේ ව්‍යවස්ථාපිත නිවාඩු දිනවලදීත්, විශේෂයෙන් ම අලුත් අවුරුදු නිවාඩු සමයේදීත්, ආපනශාලාව විවෘතව තැබිය යුතුය. තවද ආයතනයේ කළමණාකාරිත්වය විසින් කරන ලද පෙර දැනුම් දීමක දී අවශ්‍ය විටෙක ආපනශාලාව විවෘතව තැබීමට දෙවන පාර්ශවය එකඟ විය යුතුය.

11. රාත්‍රී කාලයේ අත්‍යවශ්‍ය සේවාවන්හි සේවයේ යෙදෙන සේවක මහත්ම මහත්මීන් සඳහා රාත්‍රී 11.30 ට කෙටි ආහාර සමඟ තේ, කිරිතේ සැපයීම ද, උදේ 4.00 ට තේ, කිරිතේ සැපයීම ද, දෙවන පක්‍ෂය විසින් අනිවාර්යෙන් ම සිදුකළ යුතුය. දෙවන පක්‍ෂය විසින් ඒ සඳහා බිල්පත් ඉදිරිපත් කිරීමෙන් පසුව ගෙවීම් පළමු පක්‍ෂය සිය අදාළ කාර්යාංශ වලින් ලබා දෙනු ඇත.

12. අප ආයතනයේ සේවක මහත්ම මහත්මීන්ට මෙන් ම පිටතින් පැමිණෙන ආගන්තුකයන් සඳහා ද අවශ්‍ය ආහාර, කෙටි ආහාර හා බීම වර්ග ලබා ගැනීම සඳහා අමතර කවුන්ටරයක් විවෘතව තැබීමට දෙවන පක්‍ෂය කටයුතු කළ යුතුය. එය පෙ.ව. 6.00 සිට ප.ව. 7.00 දක්වා විය යුතුය.

13. මෙම ගිවිසුමට අදාළ ගැණුම්කාර පාර්ශවය විසින් ම ආපනශාලාව පවත්වාගෙන යා යුතුය. කුමන හේතුවක් මතවත් ගැණුම්කරු විසින් **ආපනශාලාව පවත්වාගෙන යාමට වෙනත් පුද්ගලයෙකුට පැවරීම නොකළ යුතුය.** එවැනි පැවරීමක් සනාථ වුවහොත් වහාම මෙකී ගිවිසුම හා කොන්ත්‍රාත්තුව අවසන් කරනු ලබන අතර, ලංසුකරු විසින් තැන්පත් කරනු ලබන මුදල නැවත ගෙවනු නොලැබේ.

14. ගැණුම්කාර පාර්ශවය විසින් කොලොන්නාව තෙල් පර්යන්තයේ පාලන කළමණාකාරවරයාගෙන් කලින් ලබාගත් ලිඛිත අවසරයක් නොමැතිව කිසිදු දිනයක ආපනශාලාව වැසීමට කටයුතු නොකළ යුතුය.

15. ආපනශාලාව සඳහා යොදවනු ලබන සේවකයින්ගේ ජාතික හැඳුනුම්පත් හා ඔහු හෝ ඇය පිළිබඳ පොලිස් වාර්තා ගැණුම්කාර පාර්ශවය විසින් කොලොන්නාව පර්යන්තයේ ආරක්ෂක අංශය වෙත ලබාදිය යුතුය. එකී පොලිස් වාර්තා ලබා දුන් පසුව අදාළ සේවකයින් සඳහා ඇතුළුවීමේ අවසර පත්‍ර කොලොන්නාව පර්යන්තයේ ආරක්ෂක අංශය මඟින් ලබාදෙනු ඇත. සේවයෙන් ඉවත්ව යන සේවකයෙක් වේනොත් ඔහු- ඇය පිළිබඳව තොරතුරු වහාම කොලොන්නාව පර්යන්තයේ ආරක්ෂක අංශය වෙත වාර්තා කර එම සේවකයාගේ ඇතුළුවීමේ අවසර පත්‍රය ආරක්ෂක අංශය වෙත වහාම භාරදිය යුතුය.

16. දිමණාකාර සමාගම සතු කොලොන්නාව පර්යන්තයේ ලිඛිත අනුමැතිය ලබා නොගෙන ආපනශාලාව පවත්වා ගෙන යන ගොඩනැගිල්ලට කිසිඳු එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ වැඩි දියුණු කිරීමක් ගැණුම්කාර පාර්ශවය විසින් නොකළ යුතුය.

17. ගොඩනැගිල්ලට හෝ දිමණාකාර සමාගම සතු වෙනත් කිසියම් දේපලකට අලාභ හානි සිදු කිරීමක් කළහොත් එකී අලාභය ගැණුම්කාර පාර්ශවය විසින් දිමණාකාර පාර්ශවයට ගෙවිය යුතු අතර, එසේ නැතහොත් ගැණුම්කරු විසින් එකී දේපල තිබූ තත්ත්වයට පත් කිරීම සඳහා දැරිය යුතු සම්පූර්ණ වියදම දරා යථා තත්ත්වයට පත්කළ යුතුය.

18. නියමිත දිනදී මෙම ගොඩනැගිල්ල නිසි පරිදි ආපසු භාරදීමට ගැණුම්කරු අපොහොසත් වුවහොත් ගිවිසුම් කාලසීමාව අවසන් වූ දින සිට **දිනකට රු. 5000.00** බැගින් කුලියක් දිමණාකාර පාර්ශවයට, ගැණුම්කාර පාර්ශවය විසින් ගෙවිය යුතුය.

19. ගැණුම්කාර පාර්ශවයට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සඳහා දිමණාකාර පාර්ශවයට හිමි කොලොන්නාව පර්යන්ත භූමියට ඇතුළු වන පුද්ගලයින් සම්බන්ධයෙන් ගැණුම්කරු වගකිව යුතුය.

20. ගැණුම්කරු විසින් සාමාන්‍ය විදුලි උපකරණ භාවිතා කළයුතු අතර, වැඩි ධාරිතාවයක් ඇති උපකරණ භාවිතා කිරීමට අදහස් කරන්නේ නම් එසේ භාවිතා කිරීමට පෙර ගැණුම්කාර පාර්ශවය කොලොන්නාව පර්යන්තයේ පාලනාධිකාරියේ ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.

21. ඉදිරිපත් කර ඇති මිල ගණන් (පළමු උපලේඛණයට අනුව) දිමණාකාර සමාගමේ සේවකයින්ට මෙන්ම බාහිර අයට ද බල පැවැත්වේ.

22. සෑම ආහාර පානයකම මිල ප්‍රදර්ශනය කළයුතු අතර, පාලන මිලක් නියම කර ඇති ආහාර පාන කිසි විටෙකත් වැඩි මිලකට අලෙවි නොකළ යුතුය.

23. ගැණුම්කාර පාර්ශවය විසින් සඳහන් කරන ලද මිල ගණන් අදාල ගිවිසුම් කාලය සඳහා නොවෙනස්ව පැවතිය යුතුයි.

24. ආහාර පිළියෙල කිරීමට පෙර ඒවා නිසි පරිදි සෝදා පිළියෙල කිරීමටත් පිසන ලද ආහාර මැස්සන් සහ දූවිල්ලෙන් දූෂණය නොවන පරිදි ගබඩා කළ යුතුය.

25. ආහාර ගබඩා කිරීමේදී මස් මාංශ වෙනම අධි ශීතකරණ තුළ ගබඩා කළ යුතුය.

26. ගැණුම්කාර පාර්ශවය විසින් සකස් කරන දිවා ආහාරය සම්බා, රතු කැකුළු බත් පිඟානකට (අඩුම වශයෙන් හාල් කිලෝ එකකින් හයෙන් එකක් (1-6) සමව සම්පූර්ණ බිත්තරයක් හෝ හොඳ මාළු හෝ කුකුළු මස් (ග්‍රෑම් 80 කට නොඅඩු බර සහිතව) ලබා දීමට කටයුතු කළ යුතුය.

27. ගැණුම්කාර පාර්ශවය විසින් උදේ කෑම සැපයීමේදී පාන්, බනිස්, ආප්ප, පිට්ටු, ඉඳිආප්ප, කිරිබත්, කඩල. රතු කැකුළු බත්, මුං ඇට, රොටි, මාළු පාන්, රෝල්ස් ආදි කෑම වර්ග අටක්වත් උදේ කෑම සඳහා පිළියෙල කළ යුතුයි. දිනපතා කෑම වර්ගවල විවිධත්වයක් ඇති කළ යතුය.

28. ගැණුම්කාර පාර්ශවය විසින් සකස් කරනු ලබන දිවා ආහාරය සඳහා මාළු, මස්, බිත්තර, සමඟ බෝංචි, කැරට්. අර්තාපල්. අල, පරිප්පු. පොළොස්. බණ්ඩක්කා, වට්ටක්කා, අළු කෙසෙල්. ගෝවා, බීට්රූට්, මාළු මිරිස්, වම්බටු, තක්කාලි වැනි එළවළු වර්ගවල විවිධත්වයක් ඇති කළ යුතුය.

29. යෝගට්, අයිස්ක්‍රීම්, හා වෙනත් නිමි නිෂ්පාදනයන් ආදිය පිළිගත් ආයතනවල නිෂ්පාදන පමණක් විකිණිය යුතුය. නිෂ්පාදිත ආයතනයේ ලේබල් නොමැතිව අලෙවි නොකල යුතුය.

30. ගැණුම්කාර පාර්ශවය විසින් ආපනශාලාවේ අලෙවි කරනු ලබන සෑම ආහාර පානයක්ම රසවත් හා පිරිසිදු තත්ත්වයෙන් පැවතිය යුතුය.

31. පිසින ලද ආහාර පිළිගැන්වීමේදී ඒ සඳහා නිසි උපකරණ භාවිතා කළ යුතුය.

32. කැලි කසල බැහැර කිරීම හා නිසි ලෙස පිරිසිදුව තබා ගැනීම.

33. එක් දිනක් තුළ ඉතිරිවන ආහාර එදිනම විනාශ කළයුතු අතර, ඒවා පසු දින ප්‍රයෝජනය සඳහා කිසිසේත්ම යොදා නොගත යුතුය. සෑම දිනකම එකතු වන අපවිත්‍ර දෑ එක්කර ආයතනයෙන් යොදවා ඇති කුණු කසල ඉවත් කරන ජංගම රථයට භාරදිය යුතුය.

34. පළුදු වලින් තොර වීදුරු පිඟන් භාණ්ඩ භාවිතා කළයුතු අතර, දිනපතාම පිරිසිඳු කාරක ද්‍රව්‍යයක් යොදා ඒවා සෝදා පිරිසිඳු කළ යුතුය.

35. සෑම විටම ගොඩනැගිල්ලේ ගෙබිම බිත්ති, ගෘහ උපකරණ සහ ආහාර ගබඩා කරන රාක්ක ආදිය දිනපතා පිරිසිදු කර පවිත්‍රව තබාගත යුතුය.

36. කසල කළමනාකරණය සඳහා නිසි කසල බදුන් මුළුතැන්ගෙයි තුළ හා ආපනශාලා පරිශ්‍රයෙන් තැබීමටත්, ඒවා එදිනෙදා පිරිසිදු කිරීමටත්, වගබලා ගත යුතුය.

37. දීමණාකාර සමාගම විසින් සපයා ඇති පහසුකම් උපයෝගී කර ගෙන ගැණුම්කරු විසින් සකස් කරනු ලබන ආහාරපාන ආපනශාලාවේ අලෙවි කිරීමට පමණක් සීමා විය යුතුය. වෙනත් කිසිම හේතුවක් මත පිටස්තර ආයතන වෙනුවෙන් ආහාර පාන මෙම ආපනශාලාවේ සකස් කිරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

38. ගැණුම්කාර පාර්ශවය විසින් අලෙවි කරන ආහාර හා බීම වර්ග අත්පිට මුදලට අලෙවි කළ යුතු අතර, පෞද්ගලිකව කිසිදු පුද්ගලයෙකුට සපයනු ලබන ණය පහසුකම් සඳහා දීමණාකාකර පාර්ශවය විසින් වගකියනු නොලැබේ.

39. කිසිවිටෙකත් කල් ඉකුත් වූ හා භාවිතයට නුසුදුසු ආහාර හෝ බීම වර්ග අලෙවි නොකල යුතුය.

40. ආපනශාලාවේ සියළුම සේවකයින් පිරිසිදු ඇඳුමකින් හෝ නිළ ඇඳුමකින් සැරසී සිටීමටත්, නිය, රැවුල, කොණ්ඩය කොටට කපා සේවයේ යෙදවීමටත් ගැණුම්කාර පාර්ශවය විසින් වගබලා ගත යුතුය.

41. යම් සේවකයෙක් කිසියම් චර්ම රෝගයකින් හෝ වෙනත් කිසියම් බෝවන රෝගයකින් පෙලේ නම් ඔහු, ඇය සේවයේ නොයෙදවීමට ද, සිරීම්, කැපීම් වැනි සුළු තුවාල සහිත සේවකයින් සිටි නම් ඒවා හොඳින් ආවරණය කර සේවයේ යෙදවීමට ගැණුම්කරු වගබලා ගත යුතුය.

42. ආපනශාලාවට පැමිණෙන සංස්ථා සේවක, සේවිකාවන් හෝ වෙනත් බාහිර පුද්ගලයින් සමඟ ආරවුල් ඇතිකර නොගත යුතු අතර, කිසියම් පැමිණිල්ලක් වේ නම් ආරක්ෂක කළමණාකාරවරයාට සහ ආපනශාලා අධීක්ෂණ කමිටුව වෙත පැමිණිලි කළ යුතුය.

43. ආපනශාලාවේ සේවා නියුක්ත කරන ලද යම් පුද්ගලයෙකු අනිසි ලෙස හැසිරෙන්නේ නම් පලමු පාර්ශවයෙන් කරන ලද දැනුම් දීමකදී එම පුද්ගලයා සේවයෙන් ඉවත් කළ යුතු අතර, කොලොන්නාව පර්යන්තයේ පූර්ව ලිඛිත අවසරයෙන් තොරව එම පුද්ගලයා නැවත ආපනශාලාවේ සේවා නියුක්ත නොකළ යුතුය.

44. මෙම ආපනශාලාව සඳහා සේවකයින් බඳවා ගැනීම, ඔවුන්ට වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම, කම්කරු නීති අනුව සේවයේ යෙදවීම, අදාල ගෙවීම් සිදු කිරීම, හා ඔවුන්ගේ සේවය නිසා ඇති විය හැකි ගැටළු පිළිබඳ සම්පූර්ණ වගකීම ගැණුම්කාර පාර්ශවය සතු වගකීම වේ.

45. ගැණුම්කාර පාර්ශවය ආපනශාලාවේ සේවය කිරීමට ප්‍රමාණවත් සේවකයන් සංඛ්‍යාවක් සේවයෙහි යෙදවීමට වගබලා ගත යුතුය.

46. දීමණාකාර සමාගමට සම්බන්ධ ව කිසිම සේවක මහත්මයෙක් හෝ මහත්මියක් ආපනශාලාවේ කටයුතු වලට සම්බන්ධ කර ගැනීම තහනම් වේ.

47. ගැණුම්කාර පාර්ශවය විසින් ආපනශාලාවේ උපකරණ හා ආපනශාලාව අවට ප්‍රදේශය පිරිසිදු තත්ත්වයෙන් පවත්වා ගෙන යායුතු අතර, පාලනාධිකාරිය විසින් බලය පවරනු ලබන නිලධාරීන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ආපනශාලාව පරීක්ෂා කර බැලීමට ඉඩ දීමට එකඟ විය යුතුය.

48. දීමණාකාර සමාගමේ සුභසාධක අංශයේ නිලධාරීන් විසින් දෛනිකව ආපනශාලාව පරීක්ෂා කරනු ලබන අතර, ඔවුන්ගේ මාර්ගයෙන් ගැණුම්කරු විසින් අදාළ පැමිණිලි හෝ යෝජනා පාලනාධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

49. මෙම ගිවිසුමට අදාල ටෙන්ඩර් පෝරමයේ සඳහන් වී ඇති කොන්දේසි කඩවීමක් සම්බන්ධව දීමණාකාර පාර්ශවය වෙත පැමිණිල්ලක් ලැබුනහොත්, ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ඒ බව ඔප්පු වුවහොත් ඕනෑම වේලාවක ඔබගේ ටෙන්ඩරය අවලංගු කිරීමටද දීමණාකාර පාර්ශවයට හැකියාව ඇත.

50. ගැණුම්කරු ආපනශාලාව භාරගත් දින සිට **මාස ....... ක කාලයකට** සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ කොලොන්නාව පර්යන්තයේ ආපනශාලා සේවය සැපයීමට බැඳී සිටී.

51. ගැණුම්කරු විසින් කොලොන්නාව පර්යන්තයෙහි ආපනශාලාව සඳහා ලබාදෙන දේපල වෙනුවෙන් කාර්ය සාධක බැදුම්කරයක් (Performance Bond) ලෙස ගිවිසුම් කාලය අවුරුද්දක් දක්වා වලංගු වන පරිදි නැවත ගෙවන රුපියල් ලක්ෂයක (රු. 100,000.00 ක) තැන්පතු මුදලක් සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය නමින් මුදලින් තැන්පත් කිරීමෙන් හෝ එම වටිනාකමින් යුතු බැංකු අණකරයක් (හතර වන උපලේඛනය) ගැණුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. එකී ඇප තැන්පතුව වෙනුවෙන් කිසිඳු පොලියක් දීමණාකාර සමාගම විසින් ගැණුම්කාර පාර්ශවය වෙත ගෙවනු නොලැබේ. කොලොන්නාව පර්යන්තය විසින් සපයනු ලබන උපකරණ (ඇමුණුම් 02) සඳහා අලාභ හානි සිදුවුව හොත් මෙම ගිවිසුම් කාල සීමාව අවසානයේදී ඒවා තැන්පත් මුදලින් ආවරණය කරගනු ලබන අතර, තැන්පත් මුදලින් ඉතිරි මුදලක් වේ නම් එම මුදල මෙම ගිවිසුම අවසානයේදී ගොඩනැගිල්ලේ නිරවුල් භුක්තිය භාරදුන් වහාම කොලොන්නාව පර්යනත්ය විසින් ගැණුම්කරු වෙත ආපසු ගෙවනු ලැබේ.

52. ගැණුම්කාර පාර්ශවය දීමණාකාර සමාගම සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. ගිවිසුම් කාල සීමාව අවසන් වූ දින ගැණුම්කරු විසින් ගොඩනැගිල්ලේ නිරවුල් භුක්තිය පළමු පාර්ශවයට ආපසු භාරදිය යුතුය.

53. නියමිත කාල සීමාව අවසන් වීමට පෙර ගිවිසුම අවසන් කිරීමට ගැණුම්කරු හෝ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය අදහස් කරන්නේ නම් එකී පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත ඒ පිළිබඳව මාසයකට පෙර දැනුම් දිය යුතුය.

54. මෙම ගිවිසුම සම්බන්ධයෙන් ඇති වන සියළුම ප්‍රශ්න හා ගැටළු දීමණාකාර සිපීඑස්ටීඑල් ආයතනයේ ආපනශාලා කමිටුව වෙත ඉදිරිපත් කළයුතු අතර, එකී ප්‍රශ්න හෝ ගැටළු සම්බන්ධයෙන් සම්පාදන කමිටුවේ සභාපති විසින් ගනුලබන තිරණ අවසාන තිරණ වේ.

ඉහත ගිවිසුම කියවා බලා තේරුම් ගෙන ඉහත සඳහන් පිළිගැනීම හා කොන්දේසි වලට එකඟ වෙමින් දෙපාර්ශවය විසින් 2025**................** වන දින කොළඹදී අත්සන් තබන ලදී.

**පළමු පාර්ශවය** **දෙවන පාර්ශවය**

සාක්ෂිකරුවන්

1. නම :
   ලිපිනය :
   අත්සන :

1. නම :
   ලිපිනය :
   අත්සන :